සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (I)

## (01) සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු

පැ එකයි මිනිත්තු තිහයි

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

---

1. (i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවට වගකිව යුතු ආකාරය කාර්ය පටිපාටික රීති ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

   (ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභිනියෝජනය කරන ලද බලය ක්‍රියාත්මක කරනු ලබන බලධරයකුට කළ හැකි පත්කිරීම් මොනවා දැයි සඳහන් කරන්න.

2. (i) රාජ්‍ය සේවයට පත් කිරීම පිළිබඳ නුසුදුසුකම් මොනවා දැයි සඳහන් කරන්න.

   (ii) පරිවාස කාලයේ සිටින නිලධරයකු සම්බන්ධයෙන් පත්වීම් බලධරයාගේ වගකීම් පැහැදිලි කරන්න.

3. පහත සඳහන් පාඨවල අර්ථය පැහැදිලි කරන්න.

   (i) ආදේශකයා

   (ii) අනියම් නිලධාරියා

   (iii) කොන්ත්‍රාත් නිලධාරියා

   (iv) ස්ථිර නිලධාරියා

4. (i) මාරු මණ්ඩල හරහා ක්‍රියාත්මක නොවන මාරු කිරීම් මොනවා දැයි සඳහන් කරන්න.

   (ii) රජයේ සේවයෙන් පරිබාහිර සේවාවක් සඳහා නිලධාරියෙකු තාවකාලිකව මුදාහරිනු ලබන අවස්ථාවේ දී බලපවත්වනු ලබන කොන්දේසි මොනවා දැයි සඳහන් කරන්න.

5. (i) විශ්‍රාම ගැනීමෙන් පසු රාජ්‍ය සේවයෙන් ඉවත්ව යන නිලධාරියෙකුට දෙනු ලබන සේවා සහතිකයක ඇතුළත් කළ හැකි විස්තර මොනවා දැයි සඳහන් කරන්න.

   (ii) ඉල්ලා අස්වීම සඳහා රජයේ නිලධාරියෙකු විසින් ඉල්ලීමක් කර ඇති අවස්ථාවක දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කටයුතු කළයුතු ආකාරය පහදන්න.

6. (i) නිලධාරියෙකුට ඉකුත් නිවාඩු ලබාදිය හැකි අවස්ථා මොනවා දැයි සඳහන් කරන්න.

   (ii) (අ) ආණ්ඩුවට සේවා ඉටු කිරීම වෙනුවෙන් රජයේ නිලධාරියෙකුට ගාස්තුවක් ලබා ගත හැකි අවස්ථා මොනවා දැයි සඳහන් කරන්න.

   (ආ) දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය යනාදියේ කටයුතුවලට අදාළව රජයේ නිලධාරීන්ට ගාස්තු අය කළ හැකිවන්නේ කුමන සේවා සඳහා දැයි සඳහන් කරන්න.

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018(I)

## (02) මුදල් රෙගුලාසි

පැ එකයි මිනිත්තු තිහයි

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

1. (i) ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද රාජ්‍ය ආදායමක් ආපසු ගෙවීමට සිදුවිය හැකි අවස්ථා හතරක් සඳහන් කරන්න.
   (ii) රජයේ වාර්ෂික අයවැය ලේඛනය සැකසීමේ දී යොදා ගනු ලබන මූල්‍ය සම්පාදන ප්‍රභව පහක් සඳහන් කරන්න.
   (iii) මුදල් රෙගුලාසි 108 ප්‍රකාරව හානි සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු බලධාරීන් නම් කරන්න.

2. (i) රජයේ වාර්ෂික ඇස්තමේන්තුවලට ඇතුළත් ප්‍රධාන ඇස්තමේන්තු වර්ග සඳහන් කරන්න.
   (ii) රජයේ වියදම් ඇස්තමේන්තුවල වෙනස් කිරීම් සඳහා උපයෝගි කර ගන්නා විරමෝං ක්‍රියාපටිපාටිය උචිත නොවන අවස්ථා සඳහන් කරන්න.

3. (i) මුදල් රෙගුලාසි 102(2) ප්‍රකාරව අලාභ හානි (නැතිවීම/හානි) යන්නට ඇතුළත් නොවන අලාභ හානි වර්ග සඳහන් කරන්න.
   (ii) නැතිවීම්/හානිවීම් සිදුවන කල්හි ගතයුතු ක්‍රියාමාර්ග මොනවා දැයි සඳහන් කරන්න.

4. (i) පුද්ගල පඩිනඩි ගෙවීම් සඳහා බලය දෙනු ලබන නිලධාරියෙකු විසින් සෑහීමකට පත්විය යුතු කරුණු සඳහන් කරන්න.
   (ii) රජයේ වාර්ෂික ඇස්තමේන්තුවල පුනරාවර්තන වියදම් විෂයයන්හි ආර්ථික වර්ගීකරණ පහක් සඳහන් කරන්න.
   (iii) අත්තිකාරම් ගිණුම් කටයුතුවල නියමිත සීමාවල ඉක්මවීම් නිශ්චය කිරීමෙහි ලා අදාළ කර නොගත යුතු ගනුදෙනු මොනවා දැයි සඳහන් කරන්න.

5. (i) සහතික කිරීමේ නිලධාරියෙකු විසින් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් වූ 'රඳවා ගැනීමේ මුදල්' නිදහස් කිරීමට පෙර සලකා බැලිය යුතු කරුණු සඳහන් කරන්න.
   (ii) ඒකාබද්ධ අරමුදලින් වියදම් දැරීම සඳහා කෙරෙන ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් දෙවර්ගයකි. එම දෙවර්ගය සඳහන් කරන්න.
   (iii) රජයේ දෙපාර්තමේන්තුවක ගෙවීම් ක්‍රියාවලියේ දී අනුගමනය කළයුතු නීතිරීති පහක් සඳහන් කරන්න.

6. කෙටි සටහන් ලියන්න.
   (i) විසර්ජන පනත
   (ii) විශේෂ වොරන්ට් බලපත්‍රය
   (iii) ඒකාබද්ධ අරමුදල
   (iv) ප්‍රාරම්භක වාර්තාව
   (v) පෞද්ගලික පඩිනඩි

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018(I)

## (03) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය

පැ දෙකයි

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ එවකට පැවති අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) වෙනුවට හඳුන්වාදුන් විභාග නම් කරන්න.

   (ii) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වාර්තාවේ (1992) සඳහන් ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ පදනමක් වශයෙන් මූලික නිපුණතා සමූහයක් දක්වා ඇත. ඉන් හතරක් නම් කරන්න.

   (iii) ජාතික අධ්‍යාපන කොමිෂන් සභා නිර්දේශ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති වශයෙන් පිළිගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය කුමක් ද?

   (iv) 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත යටතේ විභාග කොමසාරිස්වරයාට උපදෙස් දීම සඳහා උපදේශක කමිටු දෙකක් පිහිටුවීමට විධිවිධාන ඇත. එම කමිටු දෙක නම් කරන්න.

   (v) 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පාසල්වල කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ අවධීන් සඳහා ශ්‍රේණි වෙන් කර ඇති ආකාරය දක්වන්න.

   (vi) 1997 අංක 32 දරන පනත යටතේ පිහිටුවන ලද ජාතික ගුරු අධ්‍යාපන අධිකාරියේ වර්තමාන තත්ත්වය කුමක් ද?

   (vii) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දුන් ප්‍රාග්වෘත්තිය අධ්‍යාපන I හා ප්‍රාග්වෘත්තිය අධ්‍යාපන II විෂයයන් වෙනුවට 1981 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ කණිෂ්ඨ ද්විතියික හා ජ්‍යෙෂ්ඨ ද්විතියික අවධි සඳහා හඳුන්වා දුන් විෂයයන් මොනවා ද?

   (viii) දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවනු ලබන පළාත් අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය දක්වන්න.

   (ix) පළාත් සභාවක් මගින් එම පළාතට අදාළ ප්‍රඥප්ති පැනවිය හැක්කේ කුමන විෂයයන් සම්බන්ධයෙන් ද?

   (x) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදය යටතේ යම් පුරවැසියෙකු තම මූලික අයිතිවාසිකම් කඩකර ඇත්නම් හෝ එසේ කඩකිරීමකට ආසන්න අවස්ථාවක් වේ නම්, ඔහු හෝ ඇය විසින් ගත හැකි පියවර කුමක් ද?

*(ලකුණු 04 × 10 = 40 යි)*

2. (i) 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවේ වෙනස්කම් අනුව ප්‍රාථමික අධ්‍යාපනය ප්‍රධාන අවධි තුනකට බෙදා ඇත. එම අවධි තුන හා එක් එක් අවධියට ඇතුළත් ශ්‍රේණි දක්වන්න.

   (ii) ඉහත ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රාථමික විෂයමාලාවේ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර හතරක් ඇත. ඒ මොනවා ද?

   (iii) ඉහත ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රාථමික අවධියේ දී ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා යොදා ඇති විධිවිධාන කවරේ ද?

   (iv) ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී භාවිත කරනු ලබන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය තුන් ආකාරයකට බෙදා ඇත. ඒ මොනවා ද?

*(ලකුණු 20 යි)*

[ 2 වන පිටුව බලන්න.

3. (i) 1986 අංක 30 දරන ගුරු අධ්‍යාපන විද්‍යා පීඨ පනත යටතේ ගුරු අධ්‍යාපන විද්‍යා පීඨයක් ආරම්භ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කළ යුතු නියෝගයක අඩංගු විධිවිධාන මොනවා ද?

   (ii) ගුරු අධ්‍යාපන විද්‍යා පීඨ මණ්ඩලයේ සංයුතිය දක්වන්න.

   (iii) ගුරු අධ්‍යාපන විද්‍යා පීඨයක, පීඨාධිපතිගේ කාර්යයන් කවරේ ද?

   (iv) ගුරු විද්‍යා පීඨ ප්‍රධාන කොමසාරිස්වරයාගේ භූමිකාව සහ කාර්ය පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

4. (i) 'පාසල් පාදක ඇගයීම' යන සංකල්පය සැකෙවින් පැහැදිලි කරන්න.

   (ii) පාසල් පාදක ඇගයීම සඳහා භාවිත කරන ඇගයීම් ක්‍රමවේද පහක් නම් කරන්න.

   (iii) පාසල් පාදක ඇගයීම් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පැන නැගී ඇති ගැටලු දෙකක් පැහැදිලි කරන්න.

   (iv) පාසල් පාදක ඇගයීම් යටතේ ශිෂ්‍ය කණ්ඩායමක් ක්ෂේත්‍ර චාරිකාවක යෙදවීමෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල කවරේ ද?

(ලකුණු 20 යි)

5. (i) ජාතික අධ්‍යාපන ආයතනය පිහිටුවීමේ අරමුණු සැකෙවින් පැහැදිලි කරන්න.

   (ii) ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය මණ්ඩලය සතු බලතල කවරේ ද?

   (iii) ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යභාරය සැකෙවින් දක්වන්න.

   (iv) ජාතික අධ්‍යාපන ආයතනයට මුදල් ලැබෙන ප්‍රභව නම් කරන්න.

(ලකුණු 20 යි)

***